# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

## ඉතිහාසය - I පත්‍රය

## පිළිතුරු සඳහා මග පෙන්වීම

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| (1) | 2 | (21) | 2 |
| (2) | 3 | (22) | 3 |
| (3) | 1 | (23) | 1 |
| (4) | 3 | (24) | 2 |
| (5) | 3 | (25) | 2 |
| (6) | 4 | (26) | 3 |
| (7) | 4 | (27) | 2 |
| (8) | 1 | (28) | 1 |
| (9) | 1 | (29) | 3 |
| (10) | 4 | (30) | 2 |
| (11) | 1 | (31) | 1 |
| (12) | 3 | (32) | 1 |
| (13) | 2 | (33) | 3 |
| (14) | 3 | (34) | 4 |
| (15) | 3 | (35) | 3 |
| (16) | 2 | (36) | 2 |
| (17) | 4 | (37) | 3 |
| (18) | 3 | (38) | 4 |
| (19) | 3 | (39) | 2 |
| (20) | 1 | (40) | 2 |


[2 වැනි පිටුව බලන්න

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

## ඉතිහාසය - II පත්‍රය

## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. අ. (i)





**එක ස්ථානයකට ලකුණු 1 බැගින් 1 × 10 = 10**

[3 වැනි පිටුව බලන්න

## අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015

1. අ. **(ii)**




**එක ස්ථානයකට ලකුණු 1 බැගින් 1 × 08 = 08**

# I කොටස

1. (ආ) **(i)** *A* - අසේල රජු
*B* - වළගම්බා රජු
*C* - හිරෝහිතෝ අධිරාජයා
*D* - වී. අයි. ලෙනින් (1 × 4 = 4)

**(ii)** 1. ශාන්ත පීතර දේවස්ථානය
2. ඉතාලිය
3. ආගමික කටයුතු සඳහා
4. මයිකල් ආන්ජිලෝ / රෆායල් (1 × 4 = 4)

**(iii)** 1. ඩයට් සභාව
2. ජපානය
3. ව්‍යවස්ථා සම්පාදනය සඳහා
4. මැක් ආතර් (1 × 4 = 4)

# II කොටස

2. **(i)** *A* - ඇරිස්ටෝටල්
*B* - ටොලමි
*C*- ප්‍රකෝපියස් (1 × 3 = 3)

**(ii)** *A* - පෙරිමියන්කුලම්
*B* - බඳුලුටැම් ලිපිය
*C* - සිතුල්පව්ව
*D* - කළුදියපොකුණ (1 × 4 = 4)

**(iii)** ආර්ථික
- මින්නේරිය, හුරුළු, කවුඩුළු වැනි වැව් හා පබ්බතන්ත වැනි ඇළ මාර්ග කරවා වාරි මාර්ග ක්ෂේත්‍රයේ දියුණුවට කටයුතු කිරීම
- කෘෂිකාර්මික සංවර්ධනයට කටයුතු කිරීම (වී වගාව)

ආගමික
- මහසෙන් රජතුමා මහායාන ධර්මය මෙරට ව්‍යාප්ත කිරීමට අනුග්‍රහය දැක්වීම
- මහාවිහාර සීමාව තුළ ජේතවන විහාරය හා ස්තූපය කරවීම
- මින්නේරිය විහාරය, ගෝකණ්ණ විහාරය, කලන්දක විහාරය ආදි වූ විහාර කරවීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)**
- අනුරාධපුර රාජධානියේ අවසාන කාලයේ දැඩි ආක්‍රමණ එල්ල වීම
උදා :- තුන්වන ක්‍රිෂ්ණ, දෙවන පරන්තක, පළමුවන රාජරාජ, පළවන රාජේන්ද්‍ර
- වාරිමාර්ග පද්ධතිය නිසිලෙස නඩත්තු නොකිරීම නිසා පරිහානියට පත්වීම හා ආර්ථිකය දුර්වල වීම
- දුර්වල පාලකයන් බලයට පත්වීම
- පස්වන මිහිඳු රජුගේ දුර්වල පාලනය නිසා හමුදාවට වැටුප් නොගෙවීම, හමුදාව මාළිගාව වටලා රජුට බලපෑම් කිරීම. රජු මාළිගය අතහැර පළා යාම
- පළමුවන රාජරාජ හා රාජෙන්ද්‍ර යන චෝල රජවරුන් එල්ල කරන ලද දැඩි ආක්‍රමණ

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

[5 වැනි පිටුව බලන්න

3. **(i)** *A* - මහසෙන් *B* - දෙවන මුගලන් *C* - දෙවන අග්බෝ (1 × 3 = 3)

**(ii)** *A* - සොරොව්ව *B* - බිසෝකොටුව
*C* - කළිඟු බැම් *D* - කුළු වැව් (1 × 4 = 4)

**(iii)** *A* - දේශපාලන

- මාඝ රජු හා පැවති යුද්ධය
- චන්ද්‍රභානු රජුගේ ප්‍රථම ආක්‍රමණය
- චන්ද්‍රභානු රජුගේ දෙවන ආක්‍රමණය ... ආදී තොරතුරු

*B* - ආගමික

- භික්ෂූන්ගේ විනය නීති පිළිබඳ දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම
- උපසම්පදා උත්සව පැවැත්වීම
- විදේශවලින් විනයධර හා ධර්මධර භික්ෂූන් වහන්සේලා ගෙන්වා ගැනීම ... ආදී තොරතුරු

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)** *A* - සංස්කෘතික

- රැකියා අනුව බෙදී ගිය කුල ක්‍රමයක් පැවතීම
- ආවාහ විවාහ කටයුතු කුල අනුව සිදු වීම
- සමාජය පීතෘ මූලික වීම
- විවිධ ජන ක්‍රීඩා පැවතීම (පන්දු කෙළිය, ඔංචිලි)
- විවිධ ආගමික උත්සව පිළිබඳ සඳහන් වීම (වෙසක්, පොසොන්, ඇසළ)
- සිරිත් විරිත් අනුගමනය කිරීම (නම් තැබීම, බත් කැවීම, විවාහය, මරණය)
- ආගමික හා ශාස්ත්‍රීය කටයුතුවල යෙදුණු කාන්තාවන් සිටීම (උලකුඩය දේවිය, පද්මාවතී දේවිය)

*B* - ආර්ථික

★ කෘෂි කර්මාන්තය

- අහස් දිය යොදා ගෙන වී වගාව සිදු කිරීම
- පොල් වගාව ව්‍යාප්ත වීම (කළුතර, බෙන්තොට)
- කුරුඳු වෙළෙඳ බෝගයක් ලෙස ප්‍රසිද්ධ වීම
- බෝග අපනයනය (පුවක්, ගම්මිරිස් ආදිය)

★ වෙළෙඳාම

- මුතු, මැණික්, ඇත්දළ අපනයන
- විදේශ වෙළෙඳාම (ඉන්දියාවෙන් කසී සළු ආනයනය, චීනයෙන් පිඟන් භාණ්ඩ ආනයනය)
- විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ වීම
- කාසි භාවිතය (දඹදෙණි යුගයේ කාසි)
- අභ්‍යන්තර වෙළෙඳාම හා සම්බන්ධ කඩවීදි

★ කර්මාන්ත

- අවශ්‍යතාවයට අනුව රෙදිපිළි නිෂ්පාදනය
- කෘෂිකාර්මික උපකරණ නිෂ්පාදනය
- ආභරණ, වළං, මැණික් ... ආදි කර්මාන්ත

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

The National e-learning Portal for The General Education

[6 වැනි පිටුව බලන්න

4. **(i)** *A* - ක්‍රි.ව. 1505 *B* - ක්‍රි.ව. 1638 *C* - ක්‍රි.ව. 1815 (1 × 3 = 3)

**(ii)** *A* - අනගාරික ධර්මපාලතුමා *B* - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
*C* - ආරුමුග නාවලර්තුමා *D* - එම්.සී. සිද්දි ලෙබ්බේ මහතා (1 × 4 = 4)

**(iii)**
- සර්වජන ඡන්ද බලය ලබා දීම
- විධායක කාරක සභා පිහිටු වීම
- පළාත් බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම
- ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම
- රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)**
- ගොවිතැන් කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීම
- ක්‍රි.ව. 1840 අංක 12 දරණ මුඩුබිම් පනත ක්‍රියාත්මක වීම
- වතු වගාව සඳහා කඳුකර ඉඩම් එළි පෙහෙළි කිරීම
- 1833 ප්‍රතිසංස්කරණවලින් අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අවලංගු කිරීම

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

5. **(i)** *A* - අපොන්සු පෙරෙයිරා ද ලසර්දා
*B* - පරරාජසේකරම්
*C* - පළවන රාජසිංහ (1 × 3 = 3)

**(ii)** *A* - ලෝරන්ස් ෆිල්
*B* - විලෙම් ෆැල්ක්
*C* - තෝමස් මේට්ලන්ඩ්
*D* - වෙස්ට් රිජ්වේ (1 × 4 = 4)

**(iii)**
- දොන් ජුවන් ධර්මපාල රජතුමා පෘතුගීසි ගැති පාලකයෙකු ලෙස කටයුතු කිරීම
- ධර්මපාල රජතුමා කතෝලික ආගම වැළඳ ගැනීම. මෙහි දී ලංකාවේ පැවති රාජ්‍ය උරුමය හා සම්ප්‍රදාය බිඳ වැටිණි. (මේ නිසා බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා ජනයා උඩරට හා සීතාවක ප්‍රදේශවලට ගමන් කිරීම නිසා භික්ෂූන් වහන්සේලාගේ සහාය නොලැබීම)
- දොන් ජුවන් ධර්මපාල රජු රාජ්‍ය පාලනයේ දී උපදෙස් හා ආරක්ෂාව පෘතුගීසීන්ගෙන් ලබා ගැනීම
- තෑගි ඔප්පුවක් මගින් පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍ය පැවරීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)**
- කොළඹ, ගාල්ල, මාතර, යාපනය දිසාවන් හා ත්‍රිකුණාමලය, මන්නාරම, කල්පිටිය වරායන් ලන්දේසීන්ට පවරා දිය යුතු වීම.
- මුහුදුබඩ ගව්වක් පළල බිම් තීරුව ලන්දේසීන්ට පැවරිය යුතු වීම.
- කන්ද උඩරට වෙළෙඳාමට, කුරුඳු තැලීමට, ඇවදඩු කපා ගැනීමට, රජු අවසර දිය යුතු වීම

මෙවැනි කොන්දේසි නිසා ලන්දේසීන්ට ශ්‍රී ලංකාවේ වෙළෙඳ බලය තහවුරු කර ගැනීමට හැකි වූ බව පැහැදිලි කළ යුතු ය.

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

The National e-learning Portal for The General Education

6. **(i)** *A* - ඩී.එස්. සේනානායක මහතා

*B* - එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

*C* - ඩඩ්ලි සේනානායක මහතා (1 × 3 = 3)

**(ii)**
- කථා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
- නීතිය ඉදිරියේ සමානව සැලකීම
- තමා කැමති රැකියාවක් කිරීමේ අයිතිය
- තමා කැමති ආගමක් ඇදහීමේ නිදහස
- වධහිංසාවලින් මිදීමේ අයිතිය ... ආදී අයිතිවාසිකම් (2 × 2 = 4)

**(iii)** (අ)
- ජනාධිපතිවරණය
- සමානුපාතික නියෝජන ක්‍රමය
- ජනමත විචාරණය

(ආ)
- ජනාධිපතිවරණය
  - මුළු මහත් ශ්‍රී ලංකාවම එකම ඡන්දකොට්ඨාසයක් බවට පත්වීම
  - ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් (ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 50%ක් ඉක්ම වූ ප්‍රමාණය) ලබා ගන්නා අපේක්ෂකයා ජයග්‍රහණය කරයි.

- සමානුපාතික නියෝජන ක්‍රමය
  - විශාල ඡන්ද කොට්ඨාස ක්‍රියාත්මක වීම
    (උදා:- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා එක් දිස්ත්‍රික්කයක් එක් ඡන්දකොට්ඨාසයක් වීම)
  - ඡන්ද අපේක්ෂකයෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වෙයි
  - තෝරා ගනු ලබන මන්ත්‍රීවරු සංඛ්‍යාව කල්තියාම තීරණය කිරීම
  - අදාළ දේශපාලන පක්ෂයට ඡන්දය දී තමා කැමති අපේක්ෂකයාට මනාපය සටහන් කිරීම
  - ඒ ඒ පාක්ෂිකයින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව ඒ ඒ පක්ෂයට ආසන හිමි වීම
  - අපේක්ෂකයින් ලබාගත් මනාප ප්‍රමාණය අනුව වැඩිම මනාප ලැබූ අනුපිළිවෙළට මන්ත්‍රීවරු තේරී පත්වීමට ඉඩ තිබීම
  - සෑම ඡන්ද කොට්ඨාසයකම බහුතර ඡන්ද සංඛ්‍යාව ලබාගත් පක්ෂයට ප්‍රසාද ආසනයක් හිමි වීම

- ජනමත විචාරණය
  - මුළු දිවයිනම එකම ඡන්ද කොට්ඨාසයක් බවට පත් වීම
  - ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සඳහා ජනතා අභිමතය ''ඔව්'' හෝ ''නැත'' ලෙස ප්‍රකාශ කිරීමට අවස්ථාව හිමි වීම
  - ඒ සඳහා සංකේත දෙකක් යොදා ගැනීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)** *A* - පාර්ලිමේන්තුව
- පාර්ලිමේන්තුව කැඳවීම
- පාර්ලිමේන්තුව විසුරුවා හැරීම
- මංගල රැස්වීමේ මුලසුන දැරීම
- පාර්ලිමේන්තු වාර අවසන් කිරීම

*B* - කැබිනට් මණ්ඩලය
- කැබිනට් මණ්ඩලයේ නායකත්වය දැරීම
- අගමැතිතුමා පත් කිරීම
- අමාත්‍යවරු පත් කිරීම
- කැබිනට් මණ්ඩලය සංශෝධනය කිරීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 04
මුළු ලකුණු 06

# III කොටස

7. **(i)** ඉන්ද්‍ර, පෘථිවි, වරුණ, අග්නි, යම (1 × 3 = 3)

**(ii)** *A* - අජාසත්

*B* - මහා පද්ම නන්ද

*C* - චන්ද්‍රගුප්ත මෞර්ය

*D* - කණිෂ්ක (1 × 4 = 4)

**(iii)** ව්‍යාප්තිය :- විවාහ - කෝසල රජුගේ සොහොයුරිය විවාහ කරගෙන කාසී රාජ්‍යය හිමිකර ගැනීම

යුද්ධ - බ්‍රහ්මදත්ත රජු සමග සටන් කොට අංග රාජ්‍යය මගධයට ඈඳා ගැනීම

මගින් භූමි ප්‍රදේශය මෙන්ම බලය ද ව්‍යාප්ත වූ ආකාරය

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)** අධ්‍යාපන ක්ෂේත්‍රය

- අධ්‍යාපනය ගුරු ගෙදර මුල් කරගෙන සිදු විය
- බ්‍රාහ්මණ, වෛශ්‍ය සහ ක්ෂත්‍රිය යන වර්ණ තුනට පමණක් අධ්‍යාපනය ලැබීමේ අයිතිය
- ඉගැන්වීම බ්‍රාහ්මණයන් විසින් පමණක් සිදු විය
- නාලන්දා, වලභි වැනි විශ්ව විද්‍යාල
- පුළුල් විෂය මාලාවක් ඉගැන්වීය
- අධ්‍යාපනයේ මූලික පදනම වූයේ ව්‍යාකරණ නිවැරදිව ඉගැන්වීමයි

සාහිත්‍ය ක්ෂේත්‍රය

- සංස්කෘත සාහිත්‍යය දියුණු විය
- පුරාණ ග්‍රන්ථ අනුගමනය කරමින් උප පුරාණ ග්‍රන්ථ 18ක් රචනා විය
- විවිධ ක්ෂේත්‍රවල නිපුණ පඬිවරු නමදෙනෙක් ජීවත් වූහ
- කාලිදාස වැනි මහා කවීන් ද, මේඝ දූතය, සකුන්තලය, කුමාර සම්භවය, රඝු වංශය වැනි අගනා සාහිත්‍ය කෘති බිහි කළහ
- නාට්‍ය, ඡන්දස්, අලංකාර, ජ්‍යෝතිර්වේදය, ගණිතය, තර්ක ශාස්ත්‍රය වැනි ක්ෂේත්‍ර යටතේ ග්‍රන්ථ රාශියක් බිහි විය

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

8. **(i)** *A* - නිකලස් කොපර්නිකස්

*B* - ජොහැන්නස් කෙප්ලර්

*C* - ගැලිලියෝ ගැලිලි (1 × 3 = 3)

**(ii)**

- ලෞකික මුහුණුවරක් ගැනීම
- ධනවතුන් කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීම
- පුද්ගලිකත්වය ඉස්මතු වන සේ නිර්මාණ කිරීමට හැකි වීම
- තරගකාරීව දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට හැකි වීම (2 × 2 = 4)

[9 වැනි පිටුව බලන්න

**(iii)** දේශපාලන

- ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා ප්‍රදේශවල යුරෝපීය බලය ව්‍යාප්ත වීම
- යටත් විජිත හිමි අධිරාජ්‍ය බිහි වීම
- යටත් විජිත ගොඩනගා ගැනීමට ඇති වූ තරගය
- යටත් විජිත බිහි වීම

ආර්ථික

- ජාත්‍යන්තර වෙළෙඳාම දියුණු වීම
- කාර්මික විප්ලවය නිසා නිෂ්පාදන ධාරිතාව ඉහළ යාම
- භාණ්ඩ පරිභෝජනය පුළුල් වීම නිසා ජීවන තත්ත්ව ඉහළ යාම
- දියුණු රටවල් හා නොදියුණු රටවල් ලෙස ලෝකයේ රටවල් කාණ්ඩ වීම
- නාවික ක්ෂේත්‍රයේ වර්ධනය
- පෙරදිග රටවල වෙළෙඳ මූලස්ථාන ගොඩනැගීම ... ආදිය

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)** (අ) මාටින් ලූතර්, ජෝන් කැල්වින්, උල්රිච් ස්විංග්ලි, ජෝන් හස්, ජෝන් වයික්ලිෆ්, ඉරාස්මස්

(ආ) යුරෝපයේ ආගමික ඒකාග්‍රතාවය බිඳී යාම
ක්‍රිස්තු සභාව බෙදී යාම
ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලපෑම දුර්වල වීම
ප්‍රාදේශීය කුමාරවරු බලවත් වීම
මිෂනාරී ව්‍යාපාර ඇති වීම

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

9. **(i)** බාල් ගංගාධාර් තිලක්, ලාලා ලජ්පත්රායි, බිපින් චන්ද්‍රපෝල් (1 × 3 = 3)

**(ii)**
- ඉංග්‍රීසීන් ඉන්දියාවේ ප්‍රදේශ ඈඳා ගැනීමේ දී අනුගමනය කළ අත්තනෝමතික ප්‍රතිපත්තිය
- ඉන්දියානු නායකයින් නිගරුවට පත් කිරීම
- ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලට ආවේණිකව පැවති හුදකලා බව නැති වීම
- බ්‍රිතාන්‍යය පාලකයින් ක්‍රිස්තියානි මිෂනාරීන්ට උදව් දීම
- ඉන්දියාවේ සම්පත් බ්‍රිතාන්‍යයට ගෙන යාම
- ඉන්දියාවේ අවශ්‍යතා නොසලකා හැරීම
- ඇෆ්ගනිස්ථානය වැනි බ්‍රිතාන්‍යයන්ගේ වෙනත් යටත් ප්‍රදේශවල ඇති වූ යුද්ධ
- හමුදාවන්ට ලබා දුන් පතරොම් හා සම්බන්ධව පැතිර ගිය කටකතා (2 × 2 = 4)

**(iii)**
- සත්‍යග්‍රහ ව්‍යාපාරය
- සහයෝගිතා වර්ජන ව්‍යාපාරය
- සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය
- උද්ඝෝෂණ ව්‍යාපාරය

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

[10 වැනි පිටුව බලන්න

**(iv)**
- වාණිජ කටයුතු ප්‍රමුඛස්ථානයක් ගැනීම
- ධනවාදී ආර්ථිකය වර්ධනය වීම
- කාර්මීකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම
- නවීන තාක්ෂණය මත පදනම් වූ සන්නිවේදන ජාලයක් ඇති කිරීමට කටයුතු කිරීම
- දුම්රිය මාර්ග, විදුලි සන්දේශ, දුරකථන, නැව් තටාකාංගන, නැව්, බර යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය සඳහා රජය මෙන්ම පෞද්ගලික අංශය ද යොමු වීම
- බටහිර ලෝකයේ දියුණු තාක්ෂණය ජපානයට ආනයනය කිරීම

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06

10. **(i)** *A* - මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය (1 × 3 = 3)

**(ii)**
- ඇල්සාස් ලොරේන් ප්‍රශ්නය
- බිස්මාක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය
- යටත් විජිත සඳහා වූ තරගය
- නැගෙනහිර යුරෝපයේ පැවති දේශපාලන ව්‍යාකූලභාවය
- ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය
- යුරෝපය පිල් දෙකකට බෙදීම
- සරයේවෝ සිද්ධිය

(2 × 2 = 4)

**(iii)**
- ඇමරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකයෙකු නොවීම
- ජර්මනියට හා රුසියාවට එහි සාමාජිකත්වය හිමිනොවීම
- ජාතීන්ගේ සංගමයට ප්‍රබල හමුදා ශක්තියක් නොතිබීම
- සාමූහිකව ලෝක සාමය ආරක්ෂා කිරීම අරමුණු කළ ද, කිසිදු රටක් කාලය හා ධනය ඒ සඳහා වැය නොකිරීම
- නිරායුධ කොමිසම පත් නොකිරීම
- ආක්‍රමණිකයන්ට එරෙහි වීමට සංගමය අපොහොසත් වීම

කරුණු සඳහා ලකුණු 02
විස්තරය ලකුණු 03
මුළු ලකුණු 05

**(iv)**
- බර්ලින් ප්‍රශ්නය
- සූවස් අර්බුදය
- කියුබානු මිසයිල අර්බුදය
- කොරියානු ප්‍රශ්නය

කරුණු 3ක් සඳහා ලකුණු 03
පැහැදිලි කිරීම ලකුණු 03
මුළු ලකුණු 06